www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉමහත් බහුතරයක් පලාත් පාලන මැතිවරනයට පිටුපායි

## Massive abstention in Sri Lankan local elections

**2009 අගෝස්තු 12**

**දීපාල් ජයසේකර විසිනි**

පසුගිය ජූලි 8 දින උතුරේ වව්නියාව හා යාපනය නගරවල පැවති පලාත් පාලන මැතිවරන දෙකෙහි ප්‍රතිපල පෙන්නුම් කරන්නේ, දිවයිනේ දෙමල සුලුතරය ආන්ඩුවෙන් පමනක් නොව දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) ද ඇතුලු විවිධ දෙමල පක්ෂ වලින් වියෝවී ඇති තරමයි.

හමුදාව විසින් මැයි මාසයේදී එල්ටීටීඊය පරාජය කිරීමෙන් පසුව, ප්‍රජාතන්ත්‍රවාදය යලි ස්ථාපනය කර ඇති බව පෙන්වීමට ආන්ඩුව මෙම මැතිවරන ප්‍රතිපලය හුවා දැක්වුව ද උතුරු පලාතේ අග නගරය වන යාපනයේ ඡන්දදායක සහභාගිත්වය යන්තම් සියයට 22 ක් පමනි. වව්නියාවේ එය සියයට 52 කි.

යාපනය නගර සභාවේ ආසන 23 න් 13 ක පටු බහුතරයක් ආන්ඩුවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට හිමිවිය. එහෙත් ලැබී ඇත්තේ ඡන්ද දායකයන්ගෙන් සියයට 10 කගේ ඡන්දය පමනක් වීමේ තතු හමුවේ එය පුහු ජයග්‍රහනයකි. මැතිවරන ව්‍යාපාරයේ ප්‍රමුඛත්වය ගෙන සිටි පාලක සන්ධානයේ ඊපීඩීපී පක්ෂය, ආන්ඩුවෙන් ඇත්ව සිටීම සඳහා මුලින් සිය ලාංඡනය යටතේ තරග කිරීමට ගෙන තිබූ තීන්දුව, ජනාධිපති මහින්ද රාජපක්ෂගේ බලකිරීම යටතේ වෙනස් කලේය.

ආන්ඩුවේ වාර්ගික යුද්ධයට දැක්වූ සහයෝගය හේතු කොට ගෙන ඊපීඩීපීය දෙමල ජනතාවගේ පුලුල් වෛරයට පාත්‍ර විය. එම පක්ෂයට තමන්ගේ ම අර්ධ සන්නද්ධ කල්ලියක් පැවති අතර එය, ගැටුම පැවති අවධියේ දී මිලිටරිය සමඟ අත්වැල් බැඳගෙන කටයුතු කලේය. ඔවුහු "එල්ටීටීඊ සැකකරුවන්" මරාදැමීම හෝ "අතුරුදහන් කිරීම" ද ඇතුලු මර්දනකාරී හා මැර ක්‍රියාවන්හි යෙදී සිටියහ.

ආරක්ෂක හමුදා එලිපිටම ආන්ඩුවේ පක්ෂවලට සහාය දුන් අතර, නගර දෙකෙහි ම මැතිවරන පැවැත්වුනේ මිලිටරි යටත් කිරීමක කොන්දේසි හමුවේය. මිලිටරියේ ආරක්ෂාව යටතේ තමන්ගේ ම ආරක්ෂක භටයන් ද මාධ්‍ය කන්ඩායම් ද කැටුව ආන්ඩුවේ ඇමතිවරු කටයුතු කරද්දී, විරුද්ධ අපේක්ෂකයන් තර්ජනයට හා බියගැන්වීමට ලක්විය.

"ආරක්ෂාව" පිලිබඳ ව්‍යාජ කඩතුරාව යටතේ ආන්ඩුව මැතිවරන දිනයේ දී සියලු ආන්ඩු නොවන මාධ්‍ය වලට යාපනය හා වව්නියාව තහනම් ප්‍රදේශ බවට පත්කලේය. පැරිසිය කේන්ද්‍රකොට ගත් රිපෝටර්ස් විතවුට් බෝඩර්ස් සංවිධානය පැවසුවේ තහනම, "මැතිවරනයේ විනිවිදභාවය පිලිබඳ සියලු බලාපොරොත්තු සුන්කල" බවය.

ඡන්ද දිනීම සඳහා ඊපීඩීපී ය බියගැන්වීම්, තර්ජන, අල්ලස් දීම් සමග හිස් පොරොන්දු ලබාදුන්නේ කිසිදු විලි ලැජ්ජාවකින් තොරවය. මැතිවරන ප්‍රචන්ඩ ක්‍රියා නිරීක්ෂන මධ්‍යස්ථානයේ නියෝජිතයෙකු වන සුනිල් ජයසේකරට අනුව, "ඔවුන් ආන්ඩු පක්ෂයට ඡන්දය නොදැමුව හොත් මසුන් මැරීම සඳහා බලපත් නොලැබෙන බවට ආන්ඩුවේ ආධාරකරුවන් බොහෝ ධීවර කන්ඩායම් වලට තර්ජනය කර තිබේ."

එල්ටීටීඊය පරාජය කර හමුදාවන් ලත් ජයග්‍රහනය හමුවේ දෙමල සිවිල් වැසියන් ලක්ෂ තුනකට ආසන්න සංඛ්‍යාවක් යාපනය හා වව්නියාවේ මිලිටරි පාලනය යටතේ ඇති රැඳවුම් කඳවුරු තුලට කොටුකර ඇත. ජූලි මාසයේ අග විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කරන ලද සමීක්ෂනයකට අනුව "යාපනය නගර සභා මැතිවරනයේදී ඡන්දය දීමට සුදුසුකම් ලත් ඡන්ද දායකයන්ගෙන් සියයට 11.6 ක් පමන දෙනා දැන් යාපනය දිස්ත්‍රික්කයේ රැඳවුම් කඳවුරු ගනනාවක් තුල රැඳී සිටින අතර, සියයට 20.9 ක් අභ්‍යන්තරව අවතැන් වූවන් ලෙස දිස්ත්‍රික්කයෙන් පිට වෙනත් තැන්වල ජීවත් වෙති."

කඳවුරු තුල සිටින අයට ඡන්දය සඳහා ලියාපදිංචි වීමට නොහැකි වුනා පමනක් නොව, ඡන්ද දායකයන්ට අල්ලස් දීමේ මාධ්‍යයක් ලෙස, ඔවුන්ගේ ඥාතීන් නිදහස් කර ගැනීමට නම් තමන්ට ඡන්දය

දෙන ලෙස ආන්ඩුවට සම්බන්ධ පක්ෂ ඔවුන්ට කියා ඇත. එජනිස අපේක්ෂක රාජදුරේ රත්නේෂ්වරන් අගෝස්තු 1 වන දින සන්ඩේ ටයිම්ස් වෙත පැවසුවේ, ඉල්ලුම්පත්‍ර බෙදාහැරීමට හා යලි පදිංචිකිරීම් සංවිධානය කිරීම සඳහා ආන්ඩුව තමන්ට බලය පවරා ඇති බවයි. ජනාධිපති රාජපක්ෂගේ එක් සොහොයුරෙක් වන ඔහුගේ ජ්‍යෙෂ්ඨ උපදේශක බැසිල් රාජපක්ෂ, මැතිවරන ව්‍යාපාරය අධීක්ෂනය කිරීමේ නිලධාරියා ලෙස පත්කොට තිබුනි.

රට තුල "ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීමේ අපගේ ප්‍රතිපත්ති වෙනුවෙන් ලැබුනු ජයග්‍රහනයක්" බව කියා සිටිමින් මැතිවරනය, "විශිෂ්ඨ ජයග්‍රනයක්" ලෙස හුවාදක්වන ජනාධිපතිගේ කථා විකාර සහගතය.

කෙසේ වෙතත් අගෝස්තු 10 වන දින දක්ෂිනාංශික අයිලන්ඩ් පත්‍රයේ කතුවැකිය, ඡන්ද දායකයන්ගේ "කැපීපෙනෙන උදාසීනත්වය" ගැන සඳහන් කරමින්, මැතිවරන පැවැත්වීමේ නුවනක්කාරකම ප්‍රශ්නයට බඳුන් කලේය. "යාපනයේ සිත් සසල කරවන පහත් ඡන්දදායක පෙලගැසීම ආන්ඩුවට මෙම පනිවිඩය නිකුත් කොට ඇත. එනම් "මේ අවස්ථාවේ ජනතාවට හදිසියෙන්ම අවශ්‍යව ඇත්තේ දේශපාලනය නොව යුද්ධයෙන් විනාශවූ ඔවුන්ගේ ජීවිත යලි ගොඩනගා ගැනීමය" යන්නයි.

වඩාත් කුඩා නගරයක් වන වව්නියාවේ දී එජනිස, එල්ටීටීඊ සමඟ පෙල ගැසී සිටි දෙමල ජාතික සන්ධානයට (ටීඑන්ඒ) මෙන්ම, මිලිටරිය සමග සමීපව කටයුතු කල තවත් අර්ධ සන්නද්ධ කන්ඩායමක් වන ආන්ඩුවට ගැති ප්‍රජාතන්ත්‍රවාදී මහජන විමුක්ති පෙරමුනටත් (ඩීපීඑල්එෆ්) පසු පසින් තෙවන ස්ථානයට පැමිනියේය. ආසන 11 න් ටීඑන්ඒ 5 ක් හා ඩීපීඑල්එෆ් 3 ක් දිනාගත් අතර, එජනිස ට හිමිවූයේ ආසන 2 ක් පමනකි. ඉතිරි අසුන විරුද්ධ පක්ෂයේ ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසය සතු විය.

ටීඑන්ඒ වැඩිම ආසන දිනාගත් පක්ෂය වුව ද ලියාපදිංචි ඡන්දදායකයන්ගෙන් එයට ප්‍රසාදය පල වූයේ සියයට 17 ක ගේ පමනි. "දෙමල ජනතාවගේ එකම නියෝජිතයා" තමන් යයි ව්‍යාජ ලෙස කියාගත් එල්ටීටීඊ යේ කුප්‍රකට ප්‍රජාතන්ත්‍රීය විරෝධී ක්‍රමවේදයන් කෙරෙහි පුලුල්ව පැතිර පැවති විරෝධය ද පහත් ඡන්ද දායක සහභාගිත්වයෙන් පෙන්නුම් කරයි. වෙනම දෙමල ඊලම් ධනේශ්වර රාජ්‍යයක් සඳහා වූ එල්ටීටීඊ ක්‍රියාමාර්ගය නියෝජනය කලේ දෙමල ජනතාවගේ නොව, දෙමල ධනේශ්වරයේ ආසක්තයන්ය.

2002 සටන් විරාමයට මඳකට පෙර දෙමල ධනේශ්වර පක්ෂවල හවුලක් ලෙස ආරම්භ කල ටීඑන්ඒ, පසුගිය සත් වසර තිස්සේම ක්‍රියා කොට ඇත්තේ එල්ටීටීඊ හොරනෑව ලෙසය. මැයි මාසයේ එල්ටීටීඊ මිලිටරි පරාජයෙන් පසුව ටීඑන්ඒ, වඩ වඩාත් නැඹුරු වූයේ රාජපක්ෂ ආන්ඩුව සමග ගිවිසුමක් ගසාගැනීමටය. එය මැතිවරන ව්‍යාපාරයේ යෙදුනේ යුද්ධයට "දේශපාලන විසඳුමක්" වෙනුවෙනි. ඒ දෙමල ප්‍රභූ කොටස්වල ආසක්තයන් පලාත් මට්ටමේ දී ඉටු කර ගැනීම සඳහා වූ සීමිත ආකාරයක ස්වාධීනත්වයකි.

වව්නියාවේ දී වැඩිම ආසන සංඛ්‍යාව දිනාගනු ලැබුව ද ටීඑන්ඒ, යාපනයේ දී දිනාගත්තේ ආසන අටකි. යාපනයේ ඉතා අඩු සහභාගිත්වය සමඟ ගත් කල ඔවුන්ට ලැබී ඇත්තේ මුලු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 7 ක් පමනි. එම සංඛ්‍යාවන් පවා රාජපක්ෂ ආන්ඩුව කෙරෙහි විරෝධය පලකරන ඡන්ද මිස, ටීඑන්ඒ වෙත පලවූ සාධනීය ප්‍රතිචාරයක් නොවේ.

ආන්ඩු ගැති දෙමල එක්සත් විමුක්ති පෙරමුන (ටීයූඑල්එෆ්) හා මුස්ලිම්වරුන් වෙත දැස් යොමුකරගෙන සිටි ස්වාධීන කන්ඩායමක් යාපනයේ දී එක් අසුන බැගින් හිමිකර ගත්හ. කොලඹ ආන්ඩුවේ ප්‍රධාන විපක්ෂය වන එක්සත් ජාතික පක්ෂය යාපනයේ හෝ වව්නියාවේ එකදු අසුනක් හෝ දිනාගැනීමට සමත් නොවීය. 1983 දී සිවිල් යුද්ධය අරඹා ඉක්බිති දශකය පුරා ලේවැකි අයුරින් එය පෙරට ගෙන යාමේ වගකීම දැරුවේ එම පක්ෂයයි.

එදින ම පැවති ඌව පලාත්සභා මැතිවරනය, විරුද්ධ පක්ෂ පරාජයට පත්කරමින් එජනිස විසින් පහසුවෙන් ජයගත් අතර, සියයට 72.4 ක ඡන්ද ප්‍රමානයක් ලබාගෙන පලාත් සභාවේ එහි ආසන සංඛ්‍යාව 21 සිට 25 දක්වා වැඩිකර ගත්තේය. එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද ප්‍රමානය සියයට 22.3 ක් දක්වා ද ආසන සංඛ්‍යාව 12 සිට 7 දක්වා ද පහත වැටුනි.

මැයි මාසයේ පටන් රාජපක්ෂ හා එජනිස, එල්ටීටීඊය පරජය කර ලැබූ ජයග්‍රහනය සැමරීමේ උත්සව එකකින් පසුව තවෙකක් වශයෙන් පවත්වමින් වාර්ගික මනෝභාවයන් අවුස්සා තිබේ. ඌවේ ආන්ඩුව ලත් සාපේක්ෂ ඉහල ඡන්ද ප්‍රමානය පෙන්නුම් කරන්නේ, ආන්ඩුව කෙරෙහි පලවූ සැලකිය යුතු සාධනීය සහයෝගයකට වඩා, දිගට ඇදී ගිය යුද්ධයෙන් පසුව යම් සැනසීමක් හා ආන්ඩුවට විරුද්ධවාදී කඳවුරක් නොමැති වීමේ කාරනයයි. එජාප හා සිංහල ජාතිවාදී ජවිපෙ යන ප්‍රධාන විරුද්ධ පක්ෂ දෙකම යුද්ධයට සහයෝගය දුන් අතර එල්ටීටීඊයේ පරාජය ඔජවැඩූහ.

රාජපක්ෂ මැතිවරන ව්‍යාපාරයට සම්බන්ධ වූයේ බොහෝ කොටම, යුද අපරාධ හා දෙමල සිවිල් වැසියන් සිරගත කිරීම මත ඔහුගේ ආන්ඩුවට එල්ල වූ එක්සත් ජනපද හා බටහිර බලවතුන්ගේ සීමිත විවේචන ප්‍රතික්ෂේප කිරීමට මුල්වෙමිනි. ඔහු බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයට එරෙහිව 1818 හටගත් කැරැල්ල සිහිගැන්වීය. රාජපක්ෂට බටහිර විවේචන නොතකා හැරීමට හැකිවූයේ එක්සත් ජනපද එදිරිවාදීන්ගේ,

විශේෂයෙන් ම චීනයේ, ආර්ථික හා දේශපාලන සහයෝගයට පින්සිදු වන්නට පමනි.

ගෝලීය ආර්ථික පසුබෑම මගින් උග්‍ර කොට ඇති ආන්ඩුවේ දැවැන්ත මිලිටරි වියදම් මගින් ජනිත කර ඇති ආර්ථික හා සමාජ අර්බුදය, පාලක සභාගය විසින් හිතා මතාම යටපත් කොට තිබුනි. දෙමල කථාකරන වතු කම්කරුවන් අතර පක්ෂ හා වෘත්තීය සමිති ලෙස වැඩකරන හවුල් ආන්ඩුවේ කොටස්කරුවන් වන සීඩබ්ලිව්සී හා කඳුරට ජනතා පෙරමුන, ආන්ඩුවේ කප්පාදු වැඩපිලිවෙලේ ඇඟවුම් වසංකිරීමට වෑයම් කරමින් වැටුප් පිලිබඳ සාකච්ඡා කල්දැමූහ. ආන්ඩුවෙන් වෙන්වීගැනීම පිනිස කඳුරට පෙරමුන තමන්ගේ ම ලාංඡනය යටතේ තරග කලේය.

එජාප හා ජවිපෙ පෙන්නුම් කල ශෝචනීය මැතිවරන ප්‍රතිපල වලින් පිලිබිඹු කරන්නේ, ආන්ඩුව කෙරෙහි කිසිදු සැලකිය යුතු විරුද්ධත්වයක් පලකිරීමට ඔවුන්ට පැවති නොහැකියාවයි. ආසන සංඛ්‍යාව 7 සිට 1 දක්වා පහත වැටීම හමුවේ මැතිවරනය, ජවිපෙට තවත් අකරතැබ්බයක් ගෙන ආවේ ය. රාජපක්ෂ ආන්ඩුවේ නිල කොටස්කරුවෙකු නොවූව ද ජවිපෙ, සමාජ සේවා කැපීමේ හා මිලිටරි වියදම් ඉහල නැංවීමේ අයවැයට ඡන්දය දී තිබේ.

පාලක එජනිස ඉහල ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්ත ද එහි සහයෝගිතා පදනම අඩමාන ය. ආර්ථික අර්බුදයේ ඇඟවීම් වැඩ කරන ජනතාවට පැහැදිලි වීමට පටන් ගැනීමත් සමග රැල්ල ආන්ඩුවට එරෙහිව වේගයෙන් පරිවර්තනය වනු ඇත. ඌව සම්බන්ධයෙන් මෙය විශේෂිත ය. එය දිවයිනේ දුප්පත් ම ප්‍රදේශයක් වන අතර සියඹලාන්ඩුව හා රිදීමාලියද්ද වැනි තැන් වල දරිද්‍රතා මට්ටම සියයට 50 ත් වඩා ඉහලය.

© www.wsws.org